# සිරි රාම සන්දේශයේ දළඳා මන්දිරය හා තදාශ්‍රිත ප්‍රදේශ වර්ණනා කර ඇති අයුරු

සීතාවක රාජසිංහ රජුගේ අභාවයෙන් පසු ලක්දිව සිංහල රාජ්‍යය වූයේ 'සෙංකඩගල පුරවරය' යන නමින් හැඳින් වූ 'මහනුවර' නගරයයි. මෙම නගරය ස්වභාව සෞන්දර්යයේ මනා සංරක්ෂණයක් ඇති ව බිහි වූ ලක්දිව එක ම රාජධානිය ලෙස හැඳින්විය හැකිය. මන්දයත්? මෙම නගරයට ඇතුල් වීමට නම් ගිරි දුර්ග, වන දුර්ග තරණය කරමින් පැමිණිය යුතු වූ නිසා ය. එසේම හන්තාන කඳුවැටිය හා මහවැලි ගඟ මෙම රාජධානියේ තවත් ආරක්ෂක කපොලු මෙන් ම සුන්දර දසුන් ලෙස දැක්විය හැකිය. එහෙත් මෙම නගරය රාජධානියක් වශයෙන් ආරම්භ වූයේ සීතාවක රාජධානියෙන් පසුව නොවේ. ක්‍රි. ව. 1453 ගම්පළ විසූ තරුණ ජන නායකයෙකු වූ වික්‍රමබාහු කුමාරයා ''ශ්‍රී වර්ධන පුර'' නමින් නව රාජධානියක් ඉදි කළ බව සඳහන් වේ. දැදිගම ශිලා ලිපියෙහි සඳහන් වන අන්දමට 'උඩරට කාරිය' නමින් හැඳින්වුන ඒ රටෙහි තම ස්වාධීනත්වය ප්‍රකාශ කොට සේනාසම්මත වික්‍රමබාහු යන උපාධි නාමය තමන් වෙත ආරෝපණය කරගෙන එකළ උපරාජධානියක් ව පැවති කෝට්ටේ ආධිපත්‍යයෙන් වෙන් වී ප්‍රාදේශීය වශයෙන් රාජ්‍ය ගෙන ගිය බව සඳහන් වේ.[1] ඒ අනුව ජනප්‍රවාදයෙහි සඳහන් වන අන්දමට අනුවත් මොහු මහනුවර ආදි කර්තෘවරයා විය හැකිය. එහෙත් එල්. එස්. දේවරාජ නැමැත්තා විසින් ලියා ඇති ග්‍රන්ථයෙහි උඩරට රාජධානිය ආරම්භ වූයේ කවදාද? යන්න විවාදාපන්න වූවකි.[2] මහනුවර ආරම්භ කළ රජ කෙනෙකු පිළිබඳ ව රාජරත්නාකරයෙහි[3] දීර්ඝ විස්තරයක් කරන නමුත් ඒ රජතුමා කවුරුන්ද? යන්න සඳහන් කර නොමැත. රාජරත්නාකරයෙහි සඳහන් වන අන්දමට මෙම ශ්‍රී වර්ධන පුරයෙහි සිටි රජතුමා මහා බෝධිය වඩම්මවාගෙන ආ වංශයෙන් පැවතෙන්නෙකු ලෙස වැඩි දුරටත් විස්තර කෙරී ඇත. එසේම ඔහු විසින් සිදු කරන ලද ආගමික පුණ්‍ය ක්‍රියා අනුව මහාවංසයේ දෙවන කොටස වන චූලවංසයේ 'වීරවික්කම' යන නමින් හැඳින්වෙන රජු ද මොහු යැයි නිශ්චය කළ හැකිය. මෙම රජතුමා විසින් මහාවාලුකා ගංගාවට පැත්තකින් පිහිටි අලංකාර නගරයක් වූ සෙංඛණ්ඩසේල නම් වූ ශ්‍රී වර්ධන පුරවරයෙහි දන්පින් සිදු කරමින් කටයුතු කරගෙන ගිය බව එහි සඳහන් වේ.[4]

කෙසේ නමුත් බොහෝ අවුල් වියවුල් තත්වයන්ගෙන් පිරිණු මේ යුගයේ වරින් වර ග්‍රන්ථ රචනා කිරීම ද සිදුවිය. ඒ අනුව සිරි රාම සන්දේශය 19 වෙනි සියවසේ රචිත කෘතියක් සේ සැලකේ. මෙම ග්‍රන්ථය රචනා කිරීමට විශේෂ හේතුවක් ද විය. එනම් මේ රාජධානියේ අන්තිම පාලකයා මෙන්ම රාජාවලියේ අන්තිමයා ද සේ සැලකෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු 1815 දී ඉංග්‍රීසීන්ගේ යටතට පත්විය.[5] ඉන්පසු ලක්දිව අරාජක විය. කුංකුණාවේ සුමංගල හිමියන් විසින් මෙකී සිරි රාම සන්දේශය රචනා කර ඇත්තේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට දීර්ඝායුෂ පතා රාම දෙවිඳුන්හට (රාම සන්දේශයේ සඳහන් පරිදි රාම දෙවිඳුන් විෂ්ණු දෙවියන් යයි සඳහන් කරයි)[6] යවන ලද හසුනක් වශයෙනි. සිරි රාම සන්දේශයෙහි බොහෝ වර්ණනා ඇතත් මෙම ලිපියෙහි සඳහන් කරනුයේ දළදා මන්දිරය හා ඒ අවට පැවති දේවාල, නගර, වැව් ආදි වස්තූන් පිළිබඳ විස්තරයක් පමණි. සිරි රාම සන්දේශයට අනුව අනෙකුත් නගර

වර්ණනා, රාම දෙවිඳුන්ගේ වර්ණනා ආදිය දැකිය හැකිය. එහෙත් මෙහි සියලු වර්ණනා පිළිබඳ හැඳින්වීමක් නොමැත. අද දළදා මන්දිරය පිහිටා ඇති මහනුවර නගරය එදා කතුවරයාගේ ඇසින් දැක ඇත්තේ

සොත්ථිප්පසත්ථ සුවිසුද්ධ නරාධිපම්හා

ලංකංකනා තිලක භූත මනොරමම්හා

ඵීත්තප්පභූත නරනාරි ගණා කුලම්හා

සෙංකණ්ඩසේල සිරිසාර පුරා පුරම්හා

නානාදෙස ජනාලි පාළි සරණෙ පුප්ඵාසනෙ භාසනෙ

වජ්ජා වජ්ජ විචාරණෙ හතරණෙ මත්තින්ද මත්ති ගණෙ

ධම්මාධම්ම විජානනෙ බුධජනෙ සක්කාර සම්මානනෙ

යස්මිං ජාත නරා මරව සතතං කීළන්ති ගායන්ති ච

භොගින්ද භොග ඝන වට්ටුල සාරසාරො

බීභච්ඡ රුද්ද නහමුග්ගත තුංගභද්දො

භූපාල කිත්තිධවලො විය උජ්ජලන්තො

පාකාර සාර වළයො සතතං විභාති[7]

මෙහි පළමු ගාථාවෙන් සෙංකඩගල පුරවරයෙහි සිත්කලු වූ රමණීය වූ යහපත් රජවරුන් විසින් සෙවනය කරන ලද්දා වූ ධන ධාන්‍ය ආදීන්ගෙන් ආඪ්‍ය වූ ලක්දිවට මුදුන් මල්කඩක් බඳු වූ ස්ත්‍රී පුරුෂයන් විසින් නිතර ගැවසී ගත්තාවූ සියලු සම්පත්තීන්ට ආකරයක් වූ මෙම නගරයෙහි රමණීය වූ ආශ්‍රමයක් ඇති බව ප්‍රකාශිතය.

පෙර යටිනුවර ප්‍රදේශයේ හිඟුරුවැල්ගාලක සෙංකණ්ඩ නම් බමුණෙක් වාසය කළ නිසා ඒ බමුණාගේ නමින් මේ ප්‍රදේශය නම් කළ බව සඳහන් වේ. එසේම පණ්ඩිත වික්‍රමබාහු රජු සිය මෙහෙසිය වූ සෙණ්කණ්ඩ නම් දේවිය ලවා මඟුල් ගල් පිහිටුවා මේ රාජධානිය කළ බැවින් ද මීට සෙණ්කණ්ඩ යන නම ලැබී ඇතැයි ඇතැම්හු කියති. පසු කාලයක දී මෙය ශ්‍රී වර්ධන පුරය යැයි ව්‍යවහාර වී ඇත.

මෙසේ අලංකාර නගරයක් වූ මේ නගරයට නොයෙක් දිශාවන්ගෙන් මහත් ජනකායක් දවස පුරා පැමිණෙන බව දෙවෙනි ගාථාවෙන් කියවේ. මේ නගරයේ සිටින්නා වූ මැති ඇමතිවරුන් ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තව නොයෙක් දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇති බව කියති. නගරයේ සිටිනාන වූ ජනතාව දෙව්ලොව දෙවියන් හා සමානව ම නැටුම් ගැයුම් වලින් යුක්තව කෙළි දෙලෙන් වාසය

කරන බව ද කියවේ. මෙයින් පෙනී යන්නේ මේ නගරය ඒ කාලය වන විට දිව්‍ය විමානයක සිරිගත් බවය. සද්දූල වික්‍රීඩිත වෘත්තයෙන් තනා ඇති මේ පද්‍යය ඉතා අලංකාරමත් පද්‍යයක් ලෙස ද පෙන්වා දිය හැකිය.

තුන්වෙනි ගාථාවෙන් ශ්‍රී වර්ධන පුරවරයෙහි පවුර වර්ණනා කර ඇත. මේ ප්‍රාකාරය වික්‍රමබාහු රජුගේ කාලයේදී සාදන ලද්දක් සේ සැලකේ. බු. ව. 2135 දී රජ පැමිණි විමලධර්ම සූර්ය රජු විසින් නගරාරක්‍ෂාව සඳහා පවුරු වලල්ලක් තැනූ බව මහාවංශයේ සඳහන් වේ.[8] ඉන්පසු විටින් විට රාජ්‍යයට පත් වූ නරපතීන් විසින් මේපවුරු වලල්ල සංවර්ධනය කිරීමෙන් දියුණු කළ බව ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන්වේ.

සිරි රාම සන්දේශ කතුවරයාගේ වර්ණනාවට අනුව සිරි දළදා මන්දිරය වර්ණනා කරන්නේ මහත් අභිමානයෙන් යුක්තවය.

විජ්ජුජ්ජාල සමාකුලං හිමකුලං සංකාස හෙමුජ්ජලං

භිත්තිත්ථම්භ තුලාකවාට ඡදනං සොපානමාලා කුලං

සිද්ධගුත්තුංග හතන්ධකාරමබිලං දෙවින්දමොලි නිභං

දාඨාධාතුඝරං සරාහි භවනං සම්භාසතෙ සබ්බදා[9]

විදුලිය සමූහයෙන් ගැවසී ගත්තා වූ හිමාලය පර්වතය වැනි වූ රත්තරන් වලින් බබලන්නා වූ බිත්ති, ටැම්, තලා, දොරකවුළු, පියැස්ස ආදියෙන් ගැවසීගත්තා වූ ඉනිමං සමූහයෙන් ගැවසීගත් ශක්‍රයාගේ කිරීටය හා සමාන වූ ගණඳුර නැසූ උස් වූ රන් කොතකින් යුක්ත වූ අනෙකුත් ප්‍රාසාදයන් මැඩ පවත්වා සිටි දළදා මන්දියක් මෙම නගරයේ ඇත.

මේ වර්ණනාව කියවන විට අපගේ සිතට වර්තමානයේ ඇති දළදා වහන්සේ වැඩසිටින දළදා මන්දිරය නිතැතින් ම සිහියට නැගෙයි. මෙහි කියවෙන පරිදි මෙකී දර්ශනය බොහෝ දුරට දළදා පෙරහැර පවත්වනු ලබන කාල සීමාවේදී දැකිය හැකිය. අවට පරිසරය තුළ විදුලි බුබුළු දැල්වෙමින් තිබෙන අවස්ථාව කෙතරම් සුන්දර ආකාරයට දැකිය හැකිද? සත්‍ය වශයෙන් ම එය හිමාලය පර්වතය පරදා සිටින අයුරක් දිස් කෙරේ. රන් වියන් මනාව පිහිටි පඩි පෙලවල් තැන් තැන්වල දක්නට ලැබෙන ටැම් කලා ආදියත් රාත්‍රි කාලයේ විදුලි ආලෝකයෙන් මුළු පරිසරයම ඒකාලෝක වන ආකාරයත් වර්තමානයේ දැකිය හැකිය. එසේම මහනුවර ප්‍රදේශය තුළ ඇති අනෙකුත් සුවිශල් මන්දිර හා සන්සන්දනය කර බලනවිට මාළිගා දර්ශනය අපගේ නෙත් සිත් ඇඳ බැඳ තබා ගැනීම වැලැක්විය නොහැකිමය. මහනුවර ප්‍රදේශයට නිතැතින්ම ආලෝකයක් ගෙන දෙන්නේ දළදා මන්දිරයෙනි. දළදා මන්දිරය දකින්නා වූ කාගේත් සිතට සුවයක් දැනීම වැලැක්විය නොහැකිමය. රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ වැඳුම් පිඳුම් ලැබූ මෙම මන්දිරය වර්තමානය වනවිට ද සියලු ම දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වන තෝතැන්නක් ලෙස පෙන්වා දිය හැකිය. පුරාතනයේ දළදා මන්දිය ආශ්‍රය

කරගෙන රාජ භවනය ද සෑදී ඇත. සිරි රාම සන්දේශ කුවරයා දක්නා පරිදි මේ වනවට එම රාජ භවනය ද මේ ආසන්නයේ පිහිටා තිබිණ. ඒ සියලු මන්දිර පරදවා දළදා මන්දිරය පමණක් ශ්‍රේෂ්ඨ ප්‍රාසාදය වශයෙන් දක්නට තිබෙන බව ගාථාවේ සඳහන් වේ.

දැනට දක්නට ලැබෙන තෙමහල් දළදා මාළිගාවේ ආරම්භය ක්‍රි. ව. 1687-1706 රාජ්‍යයට පැමිණි විමලධර්ම සූර්ය රජු විසින් තනන ලද්දකි. මේ පිළිබඳ ව මහාවංසයෙහි විස්තර වන්නේ මෙසේය. දළදා වහන්සේ උදෙසා තුන් මහල් ප්‍රසාදය ඉදි කිරීමෙන් අනතුරුව රිදී විසිපන්දහසකින් යුත් කරඬුවක් කරවා රන් ආලේප කොට දළදා වහන්සේ එහි තැන්පත් කොට රන් රිදී, මුතු මැණික් ආදිය මෙන් ම කෙත් වතු, ඇත්, අස්, ගව, මහිෂ ආදි නොයෙක් සත්වයෝ පූජා කර තිබේ.[10] මෙවකට දළදා වහන්සේ වැඩ සිටියේ දෙල්ගමු විහාරයේය. දෙවන විමලධර්ම සූරිය රජතුමා එයි මෙම දළදා වහන්සේ වැඩමවාගෙන අවුත් මෙකී දළදා මන්දිරයේ තැන්පත් කළ බව එහි වැඩිදුරටත් සඳහන් වේ. පසුකාලීනව සිටි නර ශ්‍රේෂ්ඨයන් විසින් ද දූර්වර්ණ වූ දළදා මන්දිරය ප්‍රතිසංස්කරණය කොට වර්තමානයේ දක්නට ලැබෙන පරිදි සකස් කර ඇති බව සඳහන් වේ.

දළදා මන්දිරයට යාබද ව ඇත්තේ ශ්‍රී නාථ දේවාලයයි. එය සිරි රාම සන්දේශකරු වර්ණනා කර ඇත්තේ මෙසේය.

ලංකාලංකර භූතං සිරිධරමතුලං භූරිපාකාර රුන්ධං

වට්ටං තුට්ඨිකරං මහීධරනිභං සොමප්පභා භාසුරං

රම්මං බෙමගතං සුධාධවලිතං ලක්ඛිනිවාසාරහං

ලංකාමුත්තම නාථසෙල භවනං සම්භාසතෙ සබ්බදා[11]

නාථ දෙවිඳුන් ඊළඟ භද්‍ර කල්පයේ ලෝකයේ බුදුබවට පත් වන්නා වූ දෙවියන්ය. එම දෙවියන්ගේ දෙවොළ දළදා මන්දිරිය වර්ණනා කිරීමෙන් පසු වර්ණනා කර ඇත්තේ ඉහත සඳහන් ආකාරයටය. ලක්දිවට ආභරණයක් වන්නා වූ විශාල ප්‍රාකාරයකින් වට වූ සතුට උපදවන්නා වූ පර්වතයක් හා සමාන වූ සඳ රැස් මෙන් සිත්කළු වූ හුණු පිරියම් කරන ලද උතුම් වූ නාථ දේවාලය යම් නගරකයකට බැබලීමක් ඇති කරයිනම් ඒ දෙවොළ නාථ දෙවියන්ගේ දේවාලය ලෙස පෙන්වා දී ඇත.

නාථ දේවේන්ද්‍රයන් වනාහි දසනාථයන් අතරින් එක් දෙවතාවෙකි. අවලෝකිතේශ්වර යන අපර නාමයෙන් ද උන්වහන්සේ හඳුන්වා ඇත. මෙම මහා භද්‍ර කල්පයෙහි මෛත්‍රිය නමින් සර්වඥතා තත්වයට පත් වන්නේ එම දෙවියන්ය. ඒ අනුව නාථ දෙවිඳුන් බෝධිසත්වවරයෙකි. මේ දෙවියන් පිළිබඳ ව කාව්‍ය ශේකරයහි හා ගිරා සන්දේශයෙහි ද වර්ණනාවට බඳුන් වී ඇත.

සරි රුසිරු තරි දු

යස තෙද දිගත පසි දු

මතු වන බුදු ර	දු

සැරද තොටගමු වෙහෙර නති	දු[12]

මහත සසර සයුරෙහි කුමුටුව සර	ණ

අනත සත නිවන් පුර ගෙණ යන සිති	න

සතත සොඳුරු බුදුකුරු ගුණදම් පුර	ණ

දියත පසිඳු නතිඳුන් දැක ගොස් සොබ	න[13]

මෙබඳු අසිරිමත් දෙවි කෙනෙකුගේ දේවාළය වර්තමානයේ ද පිහිටා ඇත්තේ මේ ආකාරයටමය. පවුරු වලල්ලකින් හෙඹියා වූ මේ දෙවාලය ද සිත්කළු වූ එකකි. දළදා මන්දිරය ආශ්‍රය කරගෙන නිර්මාණය කර ඇති මේ දේවාලය වර්තමානයේ ද ඒ ස්ථානයේ ම සුරක්ෂිතව දක්නට ලැබේ.

වර්තමානයේ දක්නට ලැබෙන විෂ්ණු දේවාලය ද අලංකාර දෙවොළකි. රාම සන්දේශකරු මෙය හඳුන්වා ඇත්තේ රම සුරේන්ද්‍ර දෙවාලය ලෙසිනි. එය වර්ණනා කර ඇත්තේ

සම්පුණ්ණ ගණ්ඩ වදනත්ථන මුරු සොණි

රූපග්ගපත්ත චරණම්බුජ දෙව කඤ්ඤං

පාසාදයපත්ත සදිසං පුථු වෙජයන්තං

රාමාභිරාම භවනං සතතං විභාති[14]

මනාව පිපුණා වූ කොපුල් තල, මුහුණ, පයෝධර, කලවා හා උකුල් ප්‍රදේශ ඇති රූපයෙන් අගතැන් පත් වූ පා පියුම් ඇති දිව්‍යමය කාන්ති ඇති රූපයන්ගෙන් යුත් මහත් වූ වෛජයන්ත ප්‍රාසාදය හා සමාන වූ සිත්කළු වූ රාම භවනය හෙවත් විෂ්ණු දේවාලය නිරතුරුව මේ නගරයේ බබළයි.

මෙහි රාම දේවාලය යන නමින් හඳුන්වා ඇත්තේ විෂ්ණු දෙවාලයයි. රාම, දාමෝදර, ගරුඩධ්වජ යන නම්වලින් ද මෙය හඳුන්වා ඇත. ඒ විෂ්ණු දෙවියන්ගේ වාහනය ගුරුළෙක් වන නිසාය. නීලෝත්පල දේහයක් ඇති විෂ්ණු උපුල්වන් යන නමින් ද ප්‍රසිද්ධය. විෂ්ණු දෙවියන් වඳින උදවිය නිල් මල් නිල් වස්ත්‍ර පුදන්නේ මේ නිසාය. උත්පලවර්ණ දිව්‍ය රාජයා ද දස අවතාරයන්ගෙන් එක් දෙවතාවෙකි. මේ දිව්‍ය රාජයා සම්බුද්ධ පරිනිර්වාණ මඤ්චකය අසල සිට බුදු සසුන හා ලක්දිව ආරක්‍ෂා කිරීම සඳහා වරම් ලත් දේවතාවෙකි. ඒ බව මයුර සන්දේශයෙහි ද සඳහන් වී ඇත. ඒ මෙසේය.

දෙව්රජ ලක රකිනුව කළ නියෝගිනේ

දෙව්රජ හිමි දෙව් නුවරට වඩින දිනේ[15]

මෙබඳු භාරදූර වගකීමක් දරා සිටින විෂ්ණු දිව්‍ය රාජයාගේ ශරීර ලක්‍ෂණ විස්තර වශයෙන් මෙසේ දක්වා තිබේ.

ද්විහස්තං ශංක චක්‍රඤ්ච කිරීට මකුටාන්විතං

කුණ්ඩලාං හේමවස්ත්‍රන්තු උත්පල වර්ණ මෙවච

ගරුඩාධිවාහනාරූඪං විෂ්ණු නාථස්‍ය ලක්‍ෂණා[16]

යනුවෙන් අත් දෙකක් තිබීම, එම අත් දෙකෙහි ශංකයක් හා චක්‍රයක් දරා සිටීම, කුණ්ඩලාභරණයෙන් හා හේම වස්ත්‍ර දැරීම, නිල්වන් පාටින් යුක්තවීම, ගුරුළා වහනය කොට ඇති විෂ්ණු දෙවියන් මෙබඳු ලක්‍ෂණයන්ගෙන් ශෝභමාන වේ. මේ හා සමාන වූ දේව ප්‍රතිමාවකින් සමන්විත වූ විෂ්ණු දේවාලයක් දළදා මාළිගය ආශ්‍රිතව වර්තමානයේ ද දක්නට ලැබේ.

මුලින් සඳහන් කළ පරිදි දළදා මන්දිරය ආසන්නයේ ම රාජ භවනය ද පිහිටා ඇත. සිරි රාම සන්දේශ කතුවරයා රජ භවන වර්ණනා කිරීමේ දී රාජ මණ්ඩපය රජාංගණය ආදිය ද වර්ණනා කර ඇත. මේ තුන් ස්ථානය ම වර්ණනා කර ඇත්තේ මෙසේය.

අග්ගට්ඨ අට්ඨවංක වත්ථුසෙල කම්මජං

සෙත ථම්භ සෙත ඡත්ත ජන්තු චිත්ත කඩ්ඪනං

රාජ දස්සනාභිරාම තුංග සිංග මණ්ඩපං

දුද්ධසාරාභිජාත ඵෙණ පුඤ්ජ සන්නිභං[17]

මෙහි රාජ මණ්ඩපය යනුවෙන් වර්ණනා කර ඇත්තේ වර්තමානයේ පත්තිරිප්පුව නමින් හඳුන්වන කොටසය. ශ්‍රේෂ්ඨ වූ අටපට්ටමක හැඩයෙන් යුත් ගල් කර්මාන්තයෙන් නිමවා ඇති ජනතාවගේ සිත් ආකර්ශනය කරන්නා වූ සුදු ටැම්වලින් හා සුදු පල සෙවෙනියෙන් ද රජුගේ දර්ශනයට සිත්කළු වූ උස් රන් කොතකින් සමන්විත වූ රාජ මණ්ඩපය කිරි මුහුදෙහි උපන්නා වූ පෙණ පිඩක් හා සමානය.

දළදා මන්දිරය ආසන්නයේ මෙවැනි මන්ඩපයක් තැනීම පිළිබඳ ව බොහෝ රජවරුන්ගේ අමනාමපක් තිබූ බව කියවෙතත් වර්තමානයේ පත්තිරිප්පුව ශ්‍රී දළදා මන්දිරයේ අලංකාරය ඔප් නංවන මාළිගා පරිශ්‍රයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහි සඳහන් අන්දමට කිරි මුහුද යනුවෙන් දක්වා ඇත්තේ වර්තමනායේ මාළිගා පරිශ්‍රය තුළ දක්නට ලැබෙන වැවයි.

සජ්ඣු චුණ්ණ සීත වාලුකාතලං

දෙවධිග්ගහිත සොම්ම නිම්මලං

මන්ද මන්ද හත සීත මාරුතං

යත්ථ භාති නරවීරමංගණං[18]

රිදී සුණු වැනි සුදු පාට වැලිතලාවක් ඇති දෙවියන් විසින් අධිගෘහිත වූ සෞම්‍ය වූ නිර්මල වූ මන්ද මාරුතයෙන් සිහින් වූ පවන් ඇති නරවීරයන් හෙවත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ මළුව යම් නගරයක් බබලයිද

මෙය රජාංගණය වර්ණනා කර ඇති අයුරුය. මෙම ස්ථානය ඇතැම්විට දේව සන්හිඳ නමින් ප්‍රකටව පැවති වර්තමාන නාථ දේවාලය හා විෂ්ණු දේවාලය අතර පිහිටි විනිශ්චය ස්ථානය හෝ පත්තිරිප්පුව ඉදිරිපස ඇති මහ මළුව හෝ විය හැකි යැයි ඇතමුන්ගේ කල්පනාවයි. එහෙත් අද මෙවැනි ආකාරයේ මළුවක් අපට දක්නට නොමැත ඒ වෙනුවට අලංකාර පරිසරයකින් යුත් මහ මළුවක් දැකිය හැකි වන්නේය.

පාසාද ගම්මිය සුධාකර මන්දිරෙහි

පාකාර මණ්ඩප මවොහර ගොපුරෙහි

භෙරීනිනාද ථුති මංගල ගීතිකෙහි

රාජෙති රාජ භවනං ධජ තොරණෙහි[19]

සඳලු තලාවකින් යුත් ප්‍රාසාදයක් හා සුදුපාට මන්දිරයෙන් ද ප්‍රාකාරයෙන් ද මණ්ඩපයෙන් ද මනහර වූ බෙර නාදවලින් හා ස්තුති ගාථාවලින් නිතර ගායනා කරන්නා වූ කොඩි තොරණ හා ධජ පතාකයන්ගෙන් අලංකාර වූ රාජ මන්දිරය සෙංකඩගල පුරවරයෙහි දක්නට ලැබේ. මෙම මන්දිරය බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසු උසස් නිළධාරීන්ගේ වාසයට ගත් අතර මෙය වර්තමානයේ කෞතුක වස්තුවක් හැටියට සුරක්ෂිතව පවතී.

මහනුවර ප්‍රදේශයට දළදා මන්දිරය අලංකාරයක් වනවා සේම නුවර වැව නමින් වර්තමානයේ හඳුන්වනු ලබන කිරි මුහුද ද සිරි රාම සන්දේශයෙහි වර්ණනාවට පාත්‍ර වී තිබේ. ඒ මෙසේය.

ඡප්පදාලි පානගාර ඵුල්ලපත්ත පංකජා

කෙළිලොල පක්ඛිජාල නිච්චරජග මණ්ඩලා

කුලජාත නෙක ගච්ඡපත්ත සාඛ මඤ්ජලී

පීය තොය වාපි භාති මච්ඡ ගුම්භ නිස්සිතා

භෘංග සමූහයාට සුරාපාන ශාලාවක් වැනි වූ පිපුණා වූ පියුම් ඇති කෙළියෙහි ලොල් වූ පක්ෂි සමූහයාට රඟ මඬලක් වැනි වූ ඉවුරෙහි උපන්නා වූ නොයක් වෘක්ෂයන්ගෙන් නැමුණු ශාඛා නැමති දෝතින් බොන්නා වූ ජලය ඇති මත්ස්‍ය සමූහයාගෙන් යුත් වැව බබළයි.

මේ ගාථාවෙන් මහනුවර නගරය අලංකාර කරන්නා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් කරවන ලද වැව වර්ණනා කෙරී ඇත. මෙම වැව නිර්මාණය කිරීම සම්බන්දයෙන් ජනප්‍රවාදයක් පවතී. එනම්:- මේ නුවර ඉදිකළ වික්‍රමබාහු විසින් ජය බිම සොයන අදහසින් රාජ සේවකයෙකු ඒ සඳහා යොදන ලදි. එසේ සොයමින් යන අතරතුර වර්තමාන දළදා මාලිගය පිහිටි ස්ථානයේ නයෙකු හා මුගටියෙකු අතර පොරයක් දක්නට ලැබිණ. ඒ පොරයෙන් මුගටියා පැරදුණි. (සාමාන්‍යයෙන් නයි මුගටි ගැටුමෙන් සිදු වන්නේ මුගටියා ජයග්‍රහනය කිරීමය. එහෙත් නයා සටනින් දිනූ නිසා මෙය ජය භූමියක් සේ සැලකේ) මෙය ඇසූ රජතුමා මේ ස්ථානය ජය භූමියක් සේ සලකා එය කැනීමට පටන් ගත්තේය. ඒ බිම කැනීමේදී පළමුව කිරිමැටිත් දෙවනුව කිරි ඉදිඹුවෙකුත් හමුවිය. මේ ස්ථානයේ මාළිගාවක් කරවා දළදා මන්දිරය වශයෙන් යොදා ගැණුනි. කිරි ඉදිඹුවා දැමීමට ඒ ලඟම වැවක් තනවන ලදි. එය කිරි මුහුද නමින් පසුව ප්‍රකට විය. බෝගම්බර වැව සාදවන ලද්දේ ඒ කිරි මුහුද විශාල කිරීමෙනි. අද දක්නට ලැබෙන වැව මුල් කාලයේ තිබී ඇතිතේ බෝගම්බර ප්‍රදේශයේය. එහෙත් ශ්‍රී වික්‍රම රාජසිං රජු එය මාලිගා පරිශ්‍රය තුළ සකස් කළ බව කියවේ.[20]

ඒ අනුව සිරි රාම සන්දේශ කතුවරයා මේ වැව වර්ණනා කර ඇති ආකාරයෙන් අපගේ සිත් තුළ කිසියම් චිත්‍රණයක් ඇඳේ. හාත්පස නිතරම භෘංග සමූහයා ගැවසී සිටි. මොවුන් මෙහි රැඳි සිටින්නේ වැව පුරා නෙළුම් මල් පිපී ඇති නිසාය. ඒවායෙහි ඇති පැණි බොන්නට මී මැසි සමූහයා නිතර මෙහි පැමිණෙන අතර උන් නිතර කෙළිදෙළෙන් එහා මෙහා පියාඹමින් සිටින බව කවියා දකියි. එසේම වැව වටේ බොහෝ ගස් සිටුවා ඇති අතර සෑම ගසකම පාහේ අතු වැව දෙසට නැමී ඇත. කතුවරයා මෙය දකින්නේ පිපාසිතව තිබෙන ගස් වැවෙන් වතුර බොන්නට දෑත් දිගු කළාක් මෙන්ය. එසේම වැවේ සෑම තරනකම පාහේ මත්ස්‍යයන් ගැවසීගනිමින් සිටින අයුරක් ද දකියි. මෙය නිතැතින් ම අපගේ සිතට චිත්‍රයක් ඇඳේ.

සිව් දේවාල හාත්පස ඇති බෝධි වෘක්ෂ ද සිරි රාම සන්දේශයෙහි වර්ණනාවට භාජනය වී ඇත. ඒ මෙසේය

හිංග සංඝ රාජමච්ච නිච්චකාල සංකුලො

පත්තසාඛ ගෙහරාසි ගිම්හකාල වජ්ජිතො

සෙතබන්ධ දීඝවිථි සබ්බජන්තු තොසනො

බොධි බන්ධවාර භාති බුද්ධරාජ සෙවිතො[21]

භෘංගරාජ නැමැති රාජ අමාත්‍යයන් විසින් පිරිවරන ලද ග්‍රීෂ්ම කාලය දුරු කරන්නා වූ පත්‍ර ශාඛාවන්ගෙන් ගැවසීගත්තා වූ සියලු දෙනාම සන්තෝෂ කරන්නා වූ සුදු පාට කඳ නැමැති දික් වූ ශාඛා ඇති බුදුරජාණන් වහන්සේ විසින් සේවනය කරන ලද්දා වූ බෝධි වෘක්ෂ මේ සිව් දේවාල පරිශ්‍රයේ දක්නට ලැබේ.

මෙම වර්ණනාවට අනුව බෝධි වෘක්ෂයන් කෙබඳු ආකාරයේ ඒවා ද යන්න පැහැදිලි කර ඇත. මෙහි සඳහන් අන්දමට බෝධි කදවුරක් දක්නට ලැබෙන බව කියවෙතත් දේවාල පරිශ්‍රය තුළ බෝධි වෘක්ෂ කිහිපයක් හැරුණුකොට අද මෙවැනි ආකාරයේ බෝධි සමූහයක් දක්නට නොමැත. අද බොහෝ දෙනා විශ්වාස කරන පරිදි දක්නට ලැබෙන බෝධීන් අතරින් වැල් බෝධිය නමින් ප්‍රකට බෝධි වෘක්ෂය ප්‍රමුඛ තැනක් ගනු ලබයි. එය බොහෝ දෙනාගේ වැඳුම් පිදුම් ලබන්නට ගෞරවාරදරයට පාත්‍ර වන්නට ඉඩ සැලසී ඇත. ඇහැලේපොල වර්ණනාවේ දී එකල තිබූ බොහෝ බොධි වෘක්ෂයන් කපා දැමූ බව සඳහන් වේ. මෙහි එන වර්ණනාවට අනුව බෝධි වෘක්ෂ හාත්පස බොහෝ ඇමති ගණයා පිරිවරා ඇත. ඒ රජුගේ ආරක්ෂාවට සිටි සෙබලුන්ය. එසේම බෝධි වෘක්ෂය යනු බුදුරජාණන් වහන්සේ විසින් සේවන කරන ලද්දකි. බෝධි වෘක්ෂයෙන් හමන සිහිල් සුලඟ නිසා ග්‍රීෂ්ම කාලයේ දී වුවත් මේ බෝ ගස් යට සිටීමෙන් සිහිල් බවක් ඇති වේ. මෙවැනි වර්ණනාවක් තුලින් කතුවරයා අදහස් කර ඇත්තේ අචේතනික වස්තුවක් වුවත් බෝ ගස මිනිසාට යම් සහනයක් ගෙන දෙන්නක් බවය.

මේ ආකාරයට සිරි රාම සන්දේශයේ බොහෝ වර්ණනා දැකිය හැකිය. සන්දේශ කාව්‍යයක් රචනා කිරිමේදී හාත්පස ඇති වස්තූන් පිළිබඳ ව වර්ණනා කිරීම සන්දේශ කාව්‍යයක දැකිය හැකි ලක්ෂණයකි. ඒ අනුව යමින් සිරි රාම සනදේශ කතුවරයා ද මෙම සන්දේශ කාව්‍ය නිර්මාණය කර ඇත. මෙය කියවන පාඨකයා තුළ අවට පරිසරය කෙබඳු ස්වරූපයකින් පැවතුනේ ද යන්න පිළිබඳ ව මනා වැටහීමක් ලබා ගත හැකි පරිදි වර්ණනාවට ලක් වී ඇති බව කිවයුතුය. මීට අමතරව දළදා පරිශ්‍රය තුළ ඇති බුද්ධ ප්‍රතිමා ධර්ම ශාලා දානශාලා ආදිය පිළිබඳව ද දීර්ඝ විස්තරයක් කෙරී ඇතත් මෙහි අරමුණ වූයේ විශේෂයෙන් දළදා මන්දිරය හා අවට ඇති දේවාල බෝධි වෘක්ෂය මෙන් ම මහනුවර නගරයට සුන්දරත්වයක් ගෙන දී ඇති වැව පිළිබඳ ව වර්ණනාවක් කිරීමය. ඒ අනුව මෙහි ඇති අනෙකුත් වර්ණනාවන් ද උසස් ගණයෙහි ලා සැලකිය හැකි බව කිව යුතුය.

ආන්තික සටහන්

---

[1] ආටිගල, නිකලස්, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පි. 643.

[2] L.S. Dewaraja, **The Kandiyan Kindom of Sri Lanka 1707-1782**, Colombo Lake House Investments LTD Book Publishers, Colombo, (Second Revised Ed.) 1988,

[3] රාජරත්නාකරය, (සංස්.) කරුණාදාස රූපසිංහ, පි. 122 - 132.

[4] ම. ව., පරි. 90, ගා. 6 -33, පි. 581 - 583.

[5] මලලසේකර, ජී. පී. ලංකා පාලි සාහිත්‍ය, පි. 218.

[6] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, පි. 57.

[7] -එම- 1 -3 ගාථා, පි. 1-4

[8] ම. ව., පරි. 93, පි. 587.

[9] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 6, පි. 6.

[10] ම. ව., පරි. 95, ගා. 5 - 15, පි. 592.

[11] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 7, පි. 7

[12]

[13]

[14] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 8, පි. 9

[15] මයූර සන්දේශය

[16] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 10, පි. 11

[17] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 12, පි. 15

[18] -එම- ගා. 13, පි. 15

[19] -එම- ගා. 14, පි. 16

[20] ම. ව., පරි. 95, පි. 615

[21] සිරි රාම සන්දේශය, සංස්. වැලිවිට ධම්මාලොක හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, ගා. 17, පි. 18

අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ
ආධුනික කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත වැලිවිට සොරත හිමි
(B.A. (Hons) M.A.)